WWW.ALEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

(පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus)

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ගිණුම්කරණය I
கணக்கீடு I
Accounting I

33 S I

2019.08.22 0830 - 1030

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- අංක 31 සිට 50 තෙක වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
- සෑම ප්‍රශ්නයකට ම **සමාන** ලකුණු හිමි වේ.
- **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

විභාග අංකය : ................................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

1. පහත කුමන ප්‍රකාශයෙන් ආයතනයක ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ **වඩාත් හොඳින්** විස්තර කරනු ලබයි ද?
   (1) ආයතනයක ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීම.
   (2) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ආයතනයක ගනුදෙනු සටහන් කිරීම.
   (3) ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ආයතනයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
   (4) කළමනාකරුවන්ගේ භාවිතය සඳහා ආයතනයක මූල්‍ය තොරතුරු සන්නිවේදනය කිරීම.
   (5) ආයතනයක ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම. (......)

2. ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ පහත පියවර **සිදුවන නිවැරදි** අනුපිළිවෙළ කුමක් ද?
   A - ලෙජර් ගිණුම් තුලනය කිරීම
   B - ගනුදෙනු සඳහා මූලාශ්‍ර ලේඛන පිළියෙල කිරීම
   C - ගනුදෙනු මූලික සටහන් පොත්වල සටහන් කිරීම
   D - ශේෂ පිරික්සුම පිළියෙල කිරීම
   E - ජර්නල් සටහන් ලෙජරයට පිටපත් කිරීම
   (1) B, C, A, E, D (2) B, C, E, A, D (3) B, C, E, D, A
   (4) C, B, E, A, D (5) C, B, D, E, A (......)

- **අංක 3, 4 සහ 5 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2019.01.01 දින මුදලින් රු. 750 000 ක් ආයෝජනය කරමින් සඳුන් විසින් වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර 2019 ජනවාරි මාසයේ දී පහත ගනුදෙනු සිදු විය.

| දිනය | විස්තරය |
|---|---|
| 2019.01.10 | ජයමාල් වෙළෙඳුන්ගෙන් රු. 500 000 ක භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදී. |
| 2019.01.12 | ජයමාල් වෙළෙඳුන්ගෙන් මිල දී ගත් රු. 50 000 ක භාණ්ඩ ආපසු යවන ලදී. |
| 2019.01.15 | රු. 400 000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 600 000 කට සිරිමල්ට අත්පිට මුදලට විකුණන ලදී. |
| 2019.01.24 | රු. 5 000 ක වට්ටමකට යටත්ව ජයමාල් වෙළෙඳුන්ට ගෙවිය යුතු මුදල පියවන ලදී. |

3. ජයමාල් වෙළෙඳුන් සමග සිදු කළ ඉහත ගනුදෙනු ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව සඳුන්ගේ ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීමට භාවිත කළ මූලාශ්‍ර ලේඛන :
   (1) ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය
   (2) ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය
   (3) ඉන්වොයිසිය, ජර්නල් වවුචරය, ගෙවීම් වවුචරය
   (4) ඉන්වොයිසිය, හරපත, ලදුපත, ගෙවීම් වවුචරය
   (5) ඉන්වොයිසිය, බැරපත, ලදුපත, ජර්නල් වවුචරය (......)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

4. සඳුන්ගේ ව්‍යාපාරයේ **2019.01.12** සිට **2019.01.24** දක්වා සිදු වූ ගනුදෙනු සටහන් කිරීමට භාවිත කළ මූලික සටහන් පොත් අනුපිළිවෙළින්:
(1) ආපසු යැවුම් ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
(2) ආපසු යැවුම් ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
(3) පොදු ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
(4) ගැනුම් ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
(5) ගැනුම් ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය (......)

5. සඳුන්ගේ ව්‍යාපාරයේ 2019 ජනවාරි මාසය සඳහා ලාභය සහ 2019.01.31 දිනට මුදල් ශේෂය කොපමණ ද?

| | **මාසය සඳහා ලාභය (රු.'000)** | **මුදල් ශේෂය (රු.'000)** |
|---|---|---|
| (1) | 200 | 155 |
| (2) | 200 | 905 |
| (3) | 205 | 155 |
| (4) | 205 | 900 |
| (5) | 205 | 905 |

(......)

● **අංක 6 සහ 7 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

පහත තොරතුරු සමන්ගේ ව්‍යාපාරයේ 2019 මාර්තු මාසයේ වැටුප් ලේඛනයෙන් උපුටා ගන්නා ලදී. මෙම ව්‍යාපාරය 2019.03.01 දින ආරම්භ කරන ලදී.

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| දළ වැටුප | 500 |
| අඩු කළා : සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේවක දායකය - 10% | 50 |
| ශුද්ධ වැටුප | 450 |
| EPF සඳහා සේව්‍ය දායකය - 15% | 75 |
| සේවක භාරකාර අරමුදලට (ETF) සේව්‍ය දායකය - 3% | 15 |

කිසියම් මාසයක EPF හා ETF ඊළඟ මාසයේ 10 වන දින ප්‍රේෂණය කරනු ලබන අතර ශුද්ධ වැටුප එම මාසය තුළම ගෙවනු ලබයි.

6. සමන්ගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනට ඉහත ගනුදෙනුවල **බලපෑම** පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වනු ලබයි ද?

| | **වත්කම් (රු.'000)** | = | **වගකීම් (රු.'000)** | + | **හිමිකම් (රු.'000)** |
|---|---|---|---|---|---|
| (1) | – 450 | | + 50 | | – 500 |
| (2) | – 450 | | + 140 | | – 590 |
| (3) | – 500 | | – | | – 500 |
| (4) | – 500 | | + 90 | | – 590 |
| (5) | – 500 | | + 140 | | – 640 |

(......)

7. 2019.03.31 දිනෙන් අවසන් මාසය සඳහා EPF වියදම් සහ 2019.03.31 දිනට EPF වගකීම සටහන් කිරීම සඳහා **නිවැරදි** ද්විත්ව සටහන කුමක් ද?

| | | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|---|
| (1) | EPF වියදම් | 50 | |
| | ගෙවිය යුතු EPF | | 50 |
| (2) | EPF වියදම් | 75 | |
| | ගෙවිය යුතු EPF | | 75 |
| (3) | EPF වියදම් | 125 | |
| | ගෙවිය යුතු EPF | | 125 |
| (4) | EPF වියදම් | 50 | |
| | වැටුප් වියදම් | 75 | |
| | ගෙවිය යුතු EPF | | 125 |
| (5) | EPF වියදම් | 75 | |
| | වැටුප් වියදම් | 50 | |
| | ගෙවිය යුතු EPF | | 125 |

(......)

8. ව්‍යාපාරයක ගිණුම්කරණ සංකල්ප භාවිතය සම්බන්ධයෙන් පහත දැක්වෙන කුමන ප්‍රකාශය **සත්‍ය** වන්නේ ද?
(1) සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවන ලද ලාභාංශ, රඳවාගත් ඉපැයුම්වලින් අඩු කර පෙන්වීම සඳහා පදනම සපයනු ලබන්නේ ඒකක සංකල්පයෙනි.
(2) ලැබිය යුතු ආදායම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කමක් ලෙස වර්ග කිරීම සඳහා පදනම සපයනු ලබන්නේ ප්‍රමාණාත්මක සංකල්පයෙනි.
(3) ණයහිමියන්ගෙන් ලද වට්ටම් ආදායමක් ලෙස හඳුනාගැනීම සඳහා පදනම සපයනු ලබන්නේ ගැළපුම් සංකල්පයෙනි.
(4) ණයගැතියන්ට දුන් වට්ටම් වියදමක් ලෙස හඳුනාගැනීම සඳහා පදනම සපයනු ලබන්නේ උපලබ්ධි සංකල්පයෙනි.
(5) අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වගකීමක් ලෙස හඳුනා ගැනීම සඳහා පදනම සපයනු ලබන්නේ විචක්ෂණ සංකල්පයෙනි. (......)

9. පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට, මූල්‍ය ප්‍රකාශන තුළ තොගය හඳුනාගැනීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්ප පදනම් සපයනු ලබයි ද?
(1) ප්‍රමාණාත්මක සහ ගැළපුම් (2) ගැළපුම් සහ කාලච්ඡේද (3) විචක්ෂණ සහ උපලබ්ධි
(4) විචක්ෂණ සහ ඓතිහාසික පිරිවැය (5) විචක්ෂණ සහ ගැළපුම් (......)

10. 2019.03.31 දින ආයතනයක සම්පූර්ණ තොගයම එහි ගබඩාවේ ඇති වූ ගින්නකින් විනාශ විය. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු.'000 |
|---|---|
| 2018.04.01 දිනට තොගය - පිරිවැයට | 750 |
| ගැනුම් | 1 750 |
| ආපසු යැවුම් | 250 |
| විකුණුම් | 2 400 |
| විකුණුම් වියදම් | 300 |

ආයතනය පිරිවැය මත 20% ක ලාභ ආන්තිකයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි.

2019.03.31 දිනට පැවැති තොගයේ පිරිවැයෙන් 80% ක් ගෙවීමට රක්ෂණ සමාගම එකඟ වී ඇත.

2019.03.31 දින විනාශ වූ තොගයේ පිරිවැය සහ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් තොග හානි අලාභය කොපමණ ද?

| | විනාශ වූ තොගයේ පිරිවැය (රු.'000) | තොග හානි අලාභය (රු.'000) |
|---|---|---|
| (1) | 250 | 50 |
| (2) | 250 | 200 |
| (3) | 330 | 66 |
| (4) | 500 | 100 |
| (5) | 500 | 400 |

(......)

www.alevelapi.com

● **අංක 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා චතුරිකා ට්‍රේඩර්ස්හි කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු.'000 |
|---|---|
| දළ ලාභය | 850 |
| පරිපාලන වියදම් | 275 |
| බෙදාහැරීමේ වියදම් | 200 |
| මූල්‍ය සහ වෙනත් වියදම් | 100 |

කෙසේ වුව ද කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසුව පහත දෑ හෙළිදරව් විය.

- 2019.03.31 දිනට ගෙවිය යුතු කාර්යාල සේවක වැටුප් රු. 30 000 ක් සහ විකුණුම් කොමිස් රු. 20 000 ක් ගිණුම්ගත කර නොමැත.
- ඉදිරියට ගෙවූ ගොඩනැගිලි කුලිය වූ රු. 40 000 ක් පරිපාලන වියදම් ලෙස ඇතුළත් කර ඇත.
- මෝටර් රථ ක්ෂය රු. 50 000 ක් බෙදාහැරීමේ වියදම් තුළ ඇතුළත් කර ඇත. කෙසේ වුව ද මෙම මෝටර් රථ කාර්යාල සේවකයින් සඳහා ප්‍රවාහන පහසුකම් ලබාදීමට භාවිත කෙරේ.

11. අදාළ ගැළපීම් කිරීමෙන් පසු, 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි පරිපාලන වියදම් සහ බෙදාහැරීමේ වියදම්:

| | පරිපාලන වියදම් (රු.' 000) | බෙදාහැරීමේ වියදම් (රු.' 000) |
|---|---|---|
| (1) | 265 | 170 |
| (2) | 265 | 220 |
| (3) | 285 | 170 |
| (4) | 315 | 170 |
| (5) | 315 | 220 |

(……)

12. අදාළ ගැළපීම් කිරීමෙන් පසු 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය:

(1) රු. 215 000 (2) රු. 225 000 (3) රු. 265 000
(4) රු. 275 000 (5) රු. 285 000 (……)

13. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ව්‍යාපාරයක ප්‍රාථමික පිරිවැය සහ මුළු නිෂ්පාදන පිරිවැය පිළිවෙළින් රු. 900 000 ක් සහ රු. 1 600 000 ක් විය. 2018.03.31 සහ 2019.03.31 දිනයන්ට නිෂ්පාදන පිරිවැයට මිනුම්කරණ ලද නොනිමි තොග පිළිවෙළින් රු. 200 000 ක් සහ රු. 330 000 ක් විය.

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය කොපමණ ද?

(1) රු. 570 000 (2) රු. 700 000 (3) රු. 830 000
(4) රු. 900 000 (5) රු. 1 030 000 (……)

14. සුභසාධක සමිතියක 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ සිටි සාමාජික සංඛ්‍යාව 150 කි. සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 2 000 ක් වේ. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී සමිතියට ලද මුදල් පහත පරිදි වේ.

- ප්‍රවර්තන වර්ෂය සඳහා සාමාජික මුදල් රු. 200 000
- පරිත්‍යාග රු. 250 000
- 2018.03.31 දින කල්පිරුණු ස්ථාවර තැන්පතුවෙන් ලද මුදල් රු. 560 000 (මෙයින් රු. 60 000 ක් පොලී ආදායම වන අතර එය 2018.03.31 දිනට ලැබිය යුතු පොලී ආදායම ලෙස හඳුනාගෙන තිබුණි.)

පරිත්‍යාග එය ලද වසරේ සිට වසර 5 ක් තුළ සමාන වාරිකවලින් ආදායමක් ලෙස හඳුනාගැනීම සමිතියේ ප්‍රතිපත්තිය වේ.

ඉහත ගනුදෙනු නිසා 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් ආදායම සහ 2019.03.31 දිනට වත්කම්වල වැඩි වීම:

| | හඳුනාගත් ආදායම (රු.'000) | වත්කම්වල වැඩිවීම (රු.'000) |
|---|---|---|
| (1) | 310 | 1 110 |
| (2) | 350 | 550 |
| (3) | 350 | 610 |
| (4) | 410 | 550 |
| (5) | 410 | 610 |

(……)

15. පහත කුමන ප්‍රකාශ හවුල් ව්‍යාපාරයකට අදාළව නිවැරදි වේ ද?

A - හවුල් ව්‍යාපාරයක ලාභාලාභ අනුපාතය වෙනස් වූ විට එහි කීර්තිනාමය ඇස්තමේන්තු කරනු ලබයි.

B - 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 42 වන වගන්තියට අනුව හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ඇස්තමේන්තු කරනු ලබයි.

C - 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව හවුල්කරුවන් වේතන සඳහා හිමිකම් නොලබයි.

D - හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරයක ලාභය ඉවත් කර ගැනීමේ ක්‍රමයක් ලෙස 'ගැනිලි' භාවිත කළ හැක.

E - 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂ මත 5% ක පොලියක් ගෙවිය යුතු වේ.

(1) A, B හා C පමණි. (2) A, C හා D පමණි. (3) B, D හා E පමණි.
(4) C, D හා E පමණි. (5) A, C, D හා E පමණි. (……)

www.alevelapi.com

● අංක 16 සහ 17 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

මධු, නිලූ සහ රාජු පිළිවෙළින් 3 : 2 : 1 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදී. 2018.04.01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ශේෂ පහත පරිදි විය:

| | මධු (රු.'000) | නිලූ (රු.'000) | රාජු (රු.'000) |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | 3 000 | 2 000 | 1 000 |
| ජංගම ගිණුම් | 400 | 200 | 100 |

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය රු. 600 000 ක ලාභයක් උපයන ලදී. 2019.03.31 දින රාජු හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත් අතර එදිනට ඔහුට ගෙවිය යුතු මුළු මුදල වූ රු. 1 500 000, ණය ගිණුමකට මාරු කරන ලදී. මධු සහ නිලූ පිළිවෙළින් 2 : 1 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් මෙදින සිට හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන ලදී. හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගළපනු ලබන අතර හවුල් ව්‍යාපාරයේ කීර්තිනාම ගිණුමක් පවත්වාගනු නොලැබේ.

16. 2019.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමයේ වටිනාකම කොපමණ ද?

(1) රු. 300 000 (2) රු. 400 000 (3) රු. 500 000
(4) රු. 1 500 000 (5) රු. 1 800 000 (……)

17. කීර්තිනාමය ගැළපීම නිසා 2019.03.31 දිනට මධු සහ නිලූගේ ප්‍රාග්ධන ගිණුම්වල ශේෂයන්ට ඇති වූ ශුද්ධ බලපෑම කොපමණ ද?

| | මධු | නිලූ |
|---|---|---|
| (1) | බලපෑමක් නොවේ. | බලපෑමක් නොවේ. |
| (2) | බලපෑමක් නොවේ. | රු. 300 000 කින් වැඩි වේ. |
| (3) | රු. 300 000 කින් අඩු වේ. | බලපෑමක් නොවේ. |
| (4) | රු. 300 000 කින් අඩු වේ. | රු. 300 000 කින් වැඩි වේ. |
| (5) | රු. 300 000 කින් වැඩි වේ. | රු. 300 000 කින් අඩු වේ. |

(……)

18. LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) ප්‍රමිතයට අනුව පහත දැක්වෙන කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

A - මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී භාවිත කරනු ලබන විශේෂිත මූලධර්ම, පදනම්, සම්ප්‍රදායන්, රීතීන් සහ පරිචයන් ගිණුම්කරණ ප්‍රතිපත්ති නම් වේ.

B - ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම්, නව තොරතුරු හෝ නව ප්‍රවණතා හේතු කොට ගෙන ඇති වේ.

C - අතීත කාලච්ඡේද වැරදි අතීතයානුයෝගී ලෙස නිවැරදි කරනු ලබන්නේ එම වැරදි මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මැනීම සම්බන්ධව ඇති වූ විට පමණි.

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (……)

19. LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව පහත දැක්වෙන කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

A - ක්ෂයවීම යනු වත්කමක ක්ෂය කළ හැකි වටිනාකම එහි ඵලදායී ජීව කාලය තුළ ක්‍රමානුකූලව බෙදාහැරීමයි.

B - ක්ෂය කළ හැකි වටිනාකම යනු වත්කමක පිරිවැය හෝ පිරිවැය සඳහා ආදේශ කළ වෙනත් අගයකින් සුන්බුන් අගය අඩු කළ විට ලැබෙන වටිනාකමයි.

C - ඵලදායී ජීව කාලය යනු, ආයතනයක් විසින් වත්කමක් භාවිත කිරීම සඳහා පවතී යැයි අපේක්ෂා කරන කාල සීමාවයි.

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (……)

20. 2019.03.01 දින සීමිත නෙතු පොදු සමාගම රු. 2 000 000 ක් ගෙවා නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කිරීමට යන්ත්‍රයක් ආනයනය කරන ලදී. සමාගම විසින් මේ සඳහා පහත වියදම් ද දරන ලදී.

| | රු.'000 |
|---|---|
| වැඩබිම සකස් කිරීම | 160 |
| යන්ත්‍රයට විදුලි සැපයුම සම්බන්ධ කිරීමේ ගාස්තු | 10 |
| මූලික පර්යේෂණ ධාවනයේ පිරිවැය | 20 |
| භාණ්ඩයේ ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රචාරණ වියදම | 60 |
| යන්ත්‍රය භාවිත කිරීම ආරම්භ කිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා ගෙවූ බලපත්‍ර ගාස්තු | 30 |
| යන්ත්‍රය භාවිතය ආරම්භ කිරීමේ සමාරම්භක උත්සවයේ පිරිවැය | 40 |

LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව හඳුනාගැනීමේ දී යන්ත්‍රයේ පිරිවැය කොපමණ ද?

(1) රු. 2 160 000 (2) රු. 2 180 000 (3) රු. 2 210 000
(4) රු. 2 220 000 (5) රු. 2 260 000 (……)

21. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත භාරක පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2019.06.20 දින අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලදී. 2019.03.31 සහ 2019.06.20 අතර කාලය තුළ පහත සිද්ධීන් සමාගමේ සිදු වී තිබුණි.

A - 2019.03.31 දිනට රු. 500 000 ක් ගෙවිය යුතු වෙළෙඳ ණයගැතියකු 2019.05.28 දින බුන්වත් වූ බව ප්‍රකාශයට පත් කරන ලදී.

B - 2019.03.31 දිනට පැවැති ලැයිස්තුගත පොදු සමාගම්වල කොටස් ආයෝජන වටිනාකම 2019.06.20 දින වන විට රු. 1 000 000 කින් පහළ ගොස් ඇත.

C - 2019.04.05 දින සමාගමට විරුද්ධව පවරන ලද නඩුවක තීන්දුව 2019.06.01 දින ලබා දුන් අතර රු. 4 000 000 ක දඩයක් රජය වෙත ගෙවීමට නියම කරන ලදී.

LKAS 10 (වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව ඉහත කුමන සිදුවීම/සිදුවීම් 2019.03.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගැළපිය යුතු ද?

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A හා C පමණි. (5) B හා C පමණි. (......)

22. LKAS 2 (තොග) ප්‍රමිතයට අනුව තොගයේ පිරිවැය තීරණය කිරීමේ දී පහත කුමන පිරිවැය අයිතමය/අයිතම ඇතුළත් කරනු නොලබයි ද?

A - අමුද්‍රව්‍ය, ශ්‍රමය හෝ වෙනත් නිෂ්පාදන පිරිවැයට අදාළව අපතේ යන ලද අසාමාන්‍ය වටිනාකම්
B - නිෂ්පාදිත භාණ්ඩ ගනුදෙනුකරුවන්ට බෙදාහරින තෙක් දරනු ලබන ගබඩා පිරිවැය
C - ප්‍රදර්ශනාගාරවල පරිපාලන පොදුකාර්ය පිරිවැය

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (......)

● **අංක 23 සහ 24 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත සාරංග පොදු සමාගමට අදාළ වේ.

| **විස්තරය** | **රු.' 000** |
|---|---|
| පිරිවැටුම | 950 |
| දළ ලාභය | 450 |
| පරිපාලන සහ බෙදාහැරීමේ වියදම් | 250 |
| ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය | 150 |
| මෝටර් රථ ප්‍රත්‍යාගණන අතිරික්තය | 75 |

වර්ෂය තුළ දී ඉඩම් ප්‍රථම වරට ද මෝටර් රථ දෙවන වරට ද ප්‍රත්‍යාගණනය කරන ලදී. 2017.03.31 දින ප්‍රථම වරට මෝටර් රථ ප්‍රත්‍යාගණනය කිරීම තුළින් රු. 35 000 ක හිගයක් ඇති විය. සමාගම සම්පූර්ණයෙන්ම හිමිකම් මගින් මූල්‍යනය කර ඇති අතර ආදායම් බදුවලින් නිදහස් ය.

23. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම විසින් හඳුනාගත් මුළු ආදායම සහ මුළු වියදම:

| | **මුළු ආදායම (රු.' 000)** | **මුළු වියදම (රු.' 000)** |
|---|---|---|
| (1) | 1 140 | 700 |
| (2) | 1 140 | 750 |
| (3) | 1 175 | 700 |
| (4) | 1 175 | 750 |
| (5) | 1 175 | 785 |

(......)

24. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම:

| | **වර්ෂය සඳහා ලාභය (රු.' 000)** | **වෙනත් විස්තීරණ ආදායම (රු.' 000)** |
|---|---|---|
| (1) | 165 | 225 |
| (2) | 200 | 225 |
| (3) | 200 | 190 |
| (4) | 235 | 190 |
| (5) | 235 | 225 |

(......)

www.alevelapi.com

**25.** පහත තොරතුරු 2019.03.31 දිනට සමාගමකට අදාළ වේ.

| | |
|---|---|
| ජංගම අනුපාතය | වාර 2 |
| ජංගම වගකීම් | රු. 60 000 |
| තොගය | රු. 48 000 |

2018.04.01 දිනට තොගය රු. 32 000 ක් විය. තවද 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් රු. 300 000 ක් වූ අතර එහි දළ ලාභ අනුපාතය 20% ක් විය.

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තොග පිරිවැටුම් අනුපාතය සහ 2019.03.31 දිනට ක්ෂණික වත්කම් අනුපාතය:

| | **තොග පිරිවැටුම් අනුපාතය (වාර)** | **ක්ෂණික වත්කම් අනුපාතය (වාර)** |
|---|---|---|
| (1) | 5 | 1.2 |
| (2) | 6 | 1.33 |
| (3) | 6 | 1.2 |
| (4) | 6.25 | 1.33 |
| (5) | 7.5 | 1.2 |

(.......)

**26.** සීමිත සමන් පොදු සමාගමේ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගණනය කළ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 20% ක් විය. කෙසේ වුව ද 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී පහත ගනුදෙනු සැලකිල්ලට ගෙන නොමැත

A - ගොඩනැගිලි පුරුෂ වරට ප්‍රත්‍යාගණනය කිරීම තුළින් ඇති වූ රු. 500 000 ක අතිරික්තය

B - රු. 800 000 ක සංචිත ප්‍රාග්ධනීකරණය කිරීම

C - රු. 200 000 ක අපසු යැවුම්

ඉහත සඳහන් කුමන ගනුදෙනුව/ගනුදෙනු නිසා සමාගමේ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතයේ **වැඩිවීමක්** සිදුවන්නේ ද?

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.

(4) A හා B පමණි. (5) B හා C පමණි. (.......)

**27.** සීමිත අමල් පොදු සමාගම භාණ්ඩයකින් ඒකක 50 000 ක් වාර්ෂිකව නිෂ්පාදනය කර විකුණනු ලබයි. ඒකකයක ප්‍රාථමික පිරිවැය රු. 20 ක් වන අතර එය විචල්‍ය පිරිවැයෙන් පමණක් සමන්විත වේ. ඒකක 50 000 ක ක්‍රියාකාරී මට්ටමේ දී නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සහ නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය පිළිවෙළින් රු. 2 000 000 ක් සහ රු. 1 500 000 ක් වේ. සමාගමේ ස්ථාවර පිරිවැය මුළු පොදු කාර්ය පිරිවැයෙන් 60% ක් වේ.

මෙම භාණ්ඩයේ ඒකකයක මුළු පිරිවැය හා ඒකකයක විචල්‍ය පිරිවැය කොපමණ ද?

| | **ඒකකයක මුළු පිරිවැය (රු.)** | **ඒකකයක විචල්‍ය පිරිවැය (රු.)** |
|---|---|---|
| (1) | 36 | 30 |
| (2) | 70 | 48 |
| (3) | 90 | 30 |
| (4) | 90 | 40 |
| (5) | 90 | 48 |

(.......)

www.alevelapi.com

**28.** තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබන සමාගමක 'X' සහ 'Y' යන නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් ඇත. මෙම නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක සඳහා පහත තොරතුරු අදාළ වේ.

| **නිෂ්පාදන දෙපාර්තමේන්තු** | **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (රු.)** | **අවශෝෂ පැය ගණන** |
|---|---|---|
| X | 200 000 | යන්ත්‍ර පැය 10 000 |
| Y | 150 000 | ශ්‍රම පැය 30 000 |

මෙම භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා රු. 50 ක් වූ සෘජු අමුද්‍රව්‍යය ද පැයකට රු. 50 ක් ලෙස සෘජු ශ්‍රමය පැය 4 ක් ද අවශ්‍ය වේ. මෙම භාණ්ඩ ඒකකයක මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ දී යන්ත්‍ර පැය 2 ක් සහ ශ්‍රම පැය 4 ක් සඳහා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කෙරේ.

භාණ්ඩ ඒකකයක් සඳහා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සහ නිෂ්පාදන පිරිවැය:

| | **ඒකකයක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (රු.)** | **ඒකකයක නිෂ්පාදන පිරිවැය (රු.)** |
|---|---|---|
| (1) | 20 | 270 |
| (2) | 25 | 310 |
| (3) | 40 | 290 |
| (4) | 60 | 310 |
| (5) | 60 | 350 |

(.......)

29. සමච්ඡේදන ලක්ෂ්‍යයේ දී පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - මුළු දායකය මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ.

B - මුළු විකුණුම් ආදායම මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ.

C - මුළු ස්ථාවර පිරිවැයෙහි සහ මුළු විචල්‍ය පිරිවැයෙහි එකතුව මුළු විකුණුම් ආදායමට සමාන වේ.

D - ඒකකයක ස්ථාවර පිරිවැය ඒකකයක විචල්‍ය පිරිවැයට සමාන වේ.

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (......)

30. ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය රු. 800 000 කි. අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී පහත කුමන සාධක මෙම ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය **අඩුවීමට** බලපායි ද?

A - වට්ටම් අනුපාතය අඩු වීම

B - ආරම්භක ආයෝජනය වැඩි වීම

C - ශුද්ධ මෙහෙයුම් මුදල් ගලා ඒම් අඩු වීම

D - ව්‍යාපෘති වාර්තාව පිළියෙල කිරීමේ පිරිවැය වැඩි වීම

(1) A හා C පමණි. (2) B හා C පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (......)

...... × ... = ලකුණු ..........

● **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

31. ව්‍යාපාරයක කළමනාකරණ ගිණුම්කරණයෙහි කාර්යභාරය සම්බන්ධයෙන් පහත ප්‍රකාශ **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| A - කළමනාකරුවන්ගේ භාවිතය සඳහා පොදු පරමාර්ථ මූල්‍ය වාර්තා පිළියෙල කරයි. | .................. |
| B - ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කරයි. | .................. |
| C - ව්‍යාපාරයක අතීත මෙන්ම අනාගත තොරතුරු සපයයි. | .................. |
| D - ව්‍යාපාරයක කළමනාකරුවන්ගේ ඉල්ලීම මත තොරතුරු ජනනය කරයි. | .................. |

32. ව්‍යාපාරයක පහත ගනුදෙනු එහි හිමිකම **වැඩිවීමට** හේතු වන්නේ ද යන්න සඳහන් කරන්න.
(වැඩි වන්නේ නම් '√' ලකුණ ද වැඩි නොවන්නේ නම් '**X**' ලකුණ ද දක්වන්න.)

| **ගනුදෙනුව** | **හිමිකමෙහි වැඩිවීම** |
|---|---|
| A - පිරිවැය රු. 50 000 ක් වූ භාණ්ඩ රු. 80 000 කට ණයට විකුණන ලදී. | .................. |
| B - අයිතිකරු විසින් රු. 200 000 ක් වටිනා උපකරණයක් ව්‍යාපාරයට සපයන ලදී. | .................. |
| C - අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් රු. 30 000 ක් වූ ව්‍යාපාරයේ ණය වාරිකයක් ගෙවන ලදී. | .................. |
| D - ණයහිමියකු පියවීමේ දී රු. 5 000 ක මුදල් වට්ටමක් ලැබුණි. | .................. |

33. පහත එක් එක් ප්‍රකාශය මගින් විස්තර කරනු ලබන **වඩාත්** උචිත ගිණුම් වාර්තාව සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **ගිණුම් වාර්තාව** |
|---|---|
| A - නිශ්චිත දිනකට ශේෂ සහිත සම්පූර්ණ ගිණුම් ලැයිස්තුව | ........................ |
| B - ආයතනයක ගිණුම් සමූහය ඇතුළත් ලේඛනය | ........................ |
| C - තොග අයිතමයක ශේෂය වෙනස්වීම් සටහන් කරනු ලබන ලේඛනය | ........................ |
| D - කිසියම් වර්ගයක ගනුදෙනු දින අනුපිළිවෙළට සටහන් කරනු ලබන ගිණුම් පොත | ........................ |

34. 2019.03.31 දිනට ව්‍යාපාරයක ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව කරන ලද විමර්ශනයේ දී පහත වැරදි අනාවරණය විය.

A - 2019 මාර්තු මාසය සඳහා විකුණුම් ජර්නලයේ එකතුව වූ රු. 540 000, ණයගැති පාලන ගිණුමට සහ විකුණුම් ගිණුමට රු. 450 000 ක් ලෙස පිටපත් කර තිබුණි.

B - ණයගැතියන්ට ලබාදුන් රු. 10 000 ක වට්ටම්, දුන් වට්ටම් ගිණුමට රු. 1 000 ක් ලෙස හර කර තිබුණි. කෙසේ වුව ද මෙම වටිනාකම නිවැරදිව ණයගැති පාලන ගිණුමට පිටපත් කර තිබුණි.

ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් ලියන්න. (සංලක්ෂ්‍ය අවශ්‍ය නොවේ.)

| වැරැද්ද | විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|---|
| A | ............................................<br>............................................ | .................... | <br>.................... |
| B | ............................................<br>............................................ | .................... | <br>.................... |

35. පහත ගිණුම්කරණ පිළිවෙත්වලට අදාළ **වඩාත්** උචිත ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

| **ගිණුම්කරණ පිළිවෙත** | **ගිණුම්කරණ සංකල්පය** |
|---|---|
| A - විකුණූ භාණ්ඩ සඳහා ලබාදුන් වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනයක් කිරීම. | .................... |
| B - මූල්‍ය කල්බදු ක්‍රමයට ගත් ගොඩනැගිල්ලක් කල්බදු ගැනුම්කරුගේ පොත්වල වත්කමක් ලෙස සටහන් කිරීම. | .................... |
| C - ක්ෂය, ලාභාලාභ ගිණුම තුළ වියදමක් ලෙස හඳුනාගැනීම. | .................... |
| D - වත්කම්, ජංගම සහ ජංගම නොවන ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කිරීම. | .................... |

36. තනි පුද්ගල වෙළෙඳ ව්‍යාපාරයකට අදාළව පහත ප්‍රකාශන **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| A - ප්‍රාග්ධන ආයෝජනය සහ රඳවාගත් ඉපැයුම්වල එකතුව හිමිකමට සමාන වේ. | .................... |
| B - ආදායම් ප්‍රකාශනය උපචිත පදනම මත පිළියෙල නොකරයි. | .................... |
| C - ගැනිලි, ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. | .................... |
| D - අයිතිකරු විසින් ව්‍යාපාරය මෙහෙයවන නිසා කළමනාකරණ ගිණුම්කරණ වාර්තා පිළියෙල කිරීම ප්‍රයෝජනවත් නොවේ. | .................... |

37. පහත තොරතුරු තනි පුද්ගල ව්‍යාපාරයක් වන අමාලි ට්‍රේඩර්ස් සඳහා 2019.03.31 දිනට සපයා ඇත.

| | රු. |
|---|---|
| මුළු වත්කම් | 2 750 000 |
| මුළු වගකීම් | 1 650 000 |

මෙම ව්‍යාපාරයේ 2018.03.31 දිනට හිමිකම රු. 800 000 ක් විය.

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී අයිතිකරු ව්‍යාපාරයෙන් රු. 250 000 ක් ගැනිලි ලෙස ලබාගත් අතර රු. 450 000 ක් අතිරේක ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරන ලදී.

පහත දෑ සඳහන් කරන්න:

(අ) 2019.03.31 දිනට හිමිකම : රු. ..........................

(ආ) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය : රු. ..........................

**38.** ලාභ නොලබන සංවිධානයක පහත තොරතුරු ලබාගත හැකි ගිණුම් නම් කරන්න.

| තොරතුරු | ගිණුම |
|---|---|
| A - වර්ෂය සඳහා හඳුනාගත් සාමාජික මුදල් ආදායම | ........................................ |
| B - වර්ෂය තුළ ලද සාමාජික මුදල් | ........................................ |
| C - වර්ෂය සඳහා අතිරික්තය හෝ හිඟය | ........................................ |
| D - වර්ෂ අවසාන හිමිකම | ........................................ |

- **අංක 39 සහ 40 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ආනන්ද සහ ජයන්ත විසින් ලිඛිත ගිවිසුමක් නොමැතිව හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදී. 2018.04.01 දින හවුල් ව්‍යාපාරයේ මෝටර් රථවල රක්ෂණ වාරිකය සඳහා රු. 250 000 ක් ආනන්ද විසින් ඔහුගේ පෞද්ගලික මුදල් භාවිත කරමින් ගෙවන ලදී. කෙසේ වුව ද 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මෙය ගළපා නොතිබූ අතර හවුල් ව්‍යාපාරය රු. 562 500 ක ලාභයක් වාර්තා කර තිබුණි. මෙම මුදල ආනන්ද විසින් හවුල් ව්‍යාපාරයට ලබා දුන් ණය මුදලක් ලෙස හඳුනාගැනීමට පසුව තීරණය කරන ලදී.

**39.** ආනන්ද විසින් ගෙවූ හවුල් ව්‍යාපාරයේ රක්ෂණ වාරිකය ණය මුදලක් ලෙස හඳුනාගැනීම සහ 2019.03.31 දිනට එම ණය මත ගෙවිය යුතු පොලිය හඳුනාගැනීමට ජර්නල් සටහන් ලියන්න.

| විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| (අ) ........................................<br>........................................<br>(ආනන්ද විසින් ගෙවූ හවුල් ව්‍යාපාරයේ රක්ෂණ වාරිකය) | .................... | .................... |
| (ආ) ........................................<br>........................................<br>(ආනන්ද විසින් ලබා දුන් ණය මත ගෙවිය යුතු පොලිය) | .................... | .................... |

**40.** පහත දෑ සඳහන් කරන්න:

(අ) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංශෝධිත ලාභය : රු. ..............................

(ආ) සංශෝධිත ලාභය මත ආනන්දගේ ලාභ කොටස : රු. ..............................

**41.** මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක රාමුවට අනුව ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක බව වැඩිදියුණු කිරීමේ ගතිලක්ෂණ **හතර** සඳහන් කරන්න.

(1) ........................................ (2) ........................................

(3) ........................................ (4) ........................................

**42.** සීමිත මානෙල් පොදු සමාගම 2015.04.01 දින රු. 1 000 000 කට යන්ත්‍රයක් මිල දී ගන්නා ලදී. මෙදිනට එහි ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 5 ක් සහ රු.100 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2018.04.01 දින රු. 280 000 ක පිරිවැයක් දරමින් මෙම යන්ත්‍රයේ ප්‍රධාන උපාංගයක් නවීකරණය කරන ලදී. මෙදින යන්ත්‍රයේ ඉතිරි ඵලදායී ජීව කාලය වසර 4 ක් ලෙස ද සුන්බුන් අගය රු. 180 000 ක් ලෙස ද නැවත ඇස්තමේන්තු කරන ලදී.

පහත දෑ ගණනය කරන්න:

(අ) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂයවීම් : රු. ..............................

(ආ) 2019.03.31 දිනට යන්ත්‍රයේ ධාරණ වටිනාකම : රු. ..............................

**43.** LKAS 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව ප්‍රතිපාදනවල සහ වෙනත් වගකීම්වල ලක්ෂණයන්හි ස්වරූපය දැක්වීම සඳහා පහත වරහන් තුළ දක්වා ඇති නිවැරදි යෙදුම තෝරන්න.

| ලක්ෂණ | ප්‍රතිපාදන | වෙනත් වගකීම් |
|---|---|---|
| A- වර්තමාන බැඳීමක් පැවතීම (**ඔව්/නැත**) | .................... | .................... |
| B- පියවීමේ දී ගෙවිය යුතු වටිනාකම (**නිශ්චිතය/අවිනිශ්චිතය**) | .................... | .................... |
| C- පියවීමේ කාලය (**නිශ්චිතය/අවිනිශ්චිතය**) | .................... | .................... |

44. සීමිත නිල්ලු පොදු සමාගමේ 2018.04.01 දිනට පහත ශේෂ පැවතුණි.

| | රු.'000 |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 100 000) | 2 000 |
| රඳවාගත් ඉපැයුම් | 800 |

2018.09.30 දින සමාගම කොටසක් රු. 20 ක ප්‍රතිෂ්ඨාවකට රු. 400 000 ක රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරන ලදි. 2018.12.31 දිනට පැවැති සෑම කොටස් 12 කටම 1 බැගින් කොටසක් රු. 10 ක ප්‍රතිෂ්ඨාවකට හිමිකම් නිකුතුවක් එදින සිදු කරන ලදි. දැනට සිටින කොටස් හිමියන් විසින් සියලුම හිමිකම් කොටස් සඳහා දායක වන ලදී. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය රු. 300 000 ක් විය.

පහත දෑ සඳහන් කරන්න:

(අ) ඉහත කොටස් නිකුත් කිරීම් නිසා සිදු වූ මුදල් ශේෂයේ වැඩි වීම : රු. ..........................

(ආ) 2019.03.31 දිනට හිමිකම : රු. ..........................

45. ආයතනයක ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය හා සම්බන්ධව පහත ප්‍රකාශ **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| | **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|---|
| A - | ඉහළ තොග පිරිවැටුම් අනුපාතයක් අඩු තොග රැඳවුම් කාලයක් පෙන්නුම් කරයි. | .......................... |
| B - | ණයගැතියන්ගෙන් මුදල් එකතු කර ගැනීම තුළින් ජංගම අනුපාතය අඩු වේ. | .......................... |
| C - | ඉහළ පොලී ආවරණ අනුපාතයක් අඩු ණය ගෙවීමේ හැකියාවක් පෙන්නුම් කරයි. | .......................... |
| D - | වසර අවසාන තොගය ශුද්ධ උපලබ්ධි අගයට මිනුම් කිරීම දළ ලාභ අනුපාතයට බලපෑමක් ඇති කරයි. | .......................... |

46. සමාගමක් විසින් අලෙවි කරන භාණ්ඩයකට පහත තොරතුරු අදාළ වේ.

| **දිනය** | **විස්තරය** | |
|---|---|---|
| 2019.07.01 | තොග ශේෂය | (ඒකකයක් රු. 3 බැගින් ඒකක 1 000) |
| 2019.07.05 | ගැනුම් | (ඒකකයක් රු. 4 බැගින් ඒකක 1 500) |
| 2019.07.12 | ගැනුම් | (ඒකකයක් රු. 6 බැගින් ඒකක 500) |
| 2019.07.28 | විකුණුම් | (ඒකකයක් රු. 10 බැගින් ඒකක 2 000) |

පහත දක්වා ඇති එක් එක් මිල කිරීමේ ක්‍රමය යටතේ පහත දෑ ගණනය කරන්න:

| **මිල කිරීමේ ක්‍රමය** | **2019 ජුලි මාසයෙහි විකුණුම් පිරිවැය (රු.)** | **2019.07.31 දිනට අවසාන තොගය (රු.)** |
|---|---|---|
| (අ) පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමය | .......................... | .......................... |
| (ආ) බරිත සාමාන්‍ය ක්‍රමය | .......................... | .......................... |

47. සමාගමක් තම නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයක යළි ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා ආර්ථික ඇණවුම් ප්‍රමාණ (EOQ) ආකෘතිය භාවිත කරයි. පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| වාර්ෂික ඉල්ලුම | ඒකක 40 000 |
| ඒකක 8 000 ක ඇණවුම් ප්‍රමාණයක දී මුළු වාර්ෂික ඇණවුම් පිරිවැය | රු. 5 000 |
| ඒකකයක වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය | රු. 5 |

පහත දෑ ගණනය කරන්න:

(අ) ඇණවුමක ඇණවුම් පිරිවැය : රු. ..........................

(ආ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය : ඒකක ..........................

**48.** සමාගමක් සතුව නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ සේවා දෙපාර්තමේන්තුවක් ඇත. සේවා දෙපාර්තමේන්තුවේ අයවැයගත පොදු කාර්ය පිරිවැය රු. 100 000 ක් වන අතර එය නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර වැඩ කළ යන්ත්‍ර පැය ගණන මත පදනම්ව නැවත බෙදාහරිනු ලැබේ. පහත අතිරේක අයවැයගත තොරතුරු ද දී ඇත.

| | නිෂ්පාදන දෙපාර්තමේන්තු I | නිෂ්පාදන දෙපාර්තමේන්තු II |
|---|---|---|
| යන්ත්‍ර පැය | 7 000 | 3 000 |
| ඒකකයක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | රු. 120 | රු. 140 |
| ඒකකයක සැකසුම් කාලය | යන්ත්‍ර පැය 3 | යන්ත්‍ර පැය 2 |

නිෂ්පාදන දෙපාර්තමේන්තු I සඳහා පහත ඇ දක්වන්න:

(අ) නැවත විභාජනය කරන ලද සේවා දෙපාර්තමේන්තු පොදු කාර්ය පිරිවැය : රු. ......................

(ආ) යන්ත්‍ර පැයකට පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාතය : රු. ......................

නිෂ්පාදන දෙපාර්තමේන්තු II සඳහා පහත ඇ දක්වන්න:

(ඉ) මුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය : රු. ......................

**49.** තරග විභාගයක් වෙනුවෙන් සංවිධානය කරන ලද **පැය 03** ක සම්මන්ත්‍රණයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ශාලා කුලිය (පැයකට) ........................................ | 10 000 |
| දේශක ගාස්තුව (පැයකට)........................................ | 15 000 |
| ප්‍රචාරණ වියදම් ........................................ | 25 000 |
| සහභාගිවන්නෙකු සඳහා දේශන සටහන් වියදම් .............. | 500 |
| සහභාගිවන්නෙකුගෙන් අය කරන සම්මන්ත්‍රණ ගාස්තුව ...... | 1 500 |

පහත ඇ ගණනය කරන්න:

(අ) සහභාගිවන්නෙකුගේ දායකය : රු. ..........................

(ආ) සම්මන්ත්‍රණයේ ස්ථාවර පිරිවැය : රු. ..........................

(ඉ) මුළු පිරිවැය ආවරණය කර ගැනීම සඳහා සහභාගි විය යුතු සංඛ්‍යාව :..............................

**50.** සමාගමක් නව ව්‍යාපෘතියක භාවිතය සඳහා රු. 900 000 ක් පිරිවැය වූ යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. එම යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 5 ක් සහ රු. 100 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත වාර්ෂික ලාභය රු. 200 000 ක් වන අතර එහි මුදල් නොවන එකම වියදම ක්ෂය වියදමයි.

මෙම ව්‍යාපෘතිය සඳහා පහත ඇ ගණනය කරන්න:

(අ) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (%) : ..............................

(ආ) පිළිගෙවුම් කාලය (වසර) : ..............................

ලකුණු

* * *

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .